2011 ජුනි
වෙළුම 8 කාණ්ඩය 1

# තේ තතු

ISSN-1391-6785 ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි.

## රිකිලි බද්ධය තුළින් ගුණාත්මක තේ පැළයක් නිපදවමු !

තේ රිකිලි බද්ධය යනු, තම අවශ්‍ය තාවයට අනුව තෝරා ගත් ලක්ෂණ සහිත තේ රිකිලි කොටස් දෙකක් එකට එකතු කර තනි ශාකයක් ලෙස වැඩීමට සැලැස්වීමයි.

තේ සඳහා සුදුසු රිකිලි බද්ධ ක්‍රමය වන්නේ කුඤ්ඤ බද්ධයයි. බද්ධය සඳහා ගනු ලබන ශාක කොටස් දෙක අනුජය සහ ග්‍රාහකය ලෙස හඳුන්වනු ලැබේ.

මේ සඳහා විවිධ ජානමය ලක්ෂණ සහිත ශාක දෙකක රිකිලි තෝරා සංයෝජනය කරනු ලබයි. සංයෝජනය කිරීමට සලකා බැලෙන විවිධ ලක්ෂණ අතර අස්වැන්න, රෝග / පළිබෝධවලට ඔරොත්තුදීම නියඟයට ඔරොත්තු දීම වැනි ලක්ෂණ වැදගත් වේ.

### තේ රිකිලි බද්ධයේ වාසි

- ❒ නියං තත්ව යටතේ වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකි වීම
- ❒ රෝග හා පළිබෝධවලට ප්‍රතිරෝධී ප්‍රභේද තෝරාගැනීමෙන් ඒවා පාලනය සඳහා වැය වන සම්පත් ඉතිරි කරගත හැකි වීම.

### බද්ධය කර ගන්නා ආකාරය

බද්ධයට ගනු ලබන අතු සාමාන්‍ය තවාන් වලට මෙන්ම තෝරා ගත යුතුය. මව් ශාක වලින් ලබා ගත් අතු ජලයේ බහා තැබිය යුතු අතර බද්ධය සෙවන සහිත ස්ථානයකදී සිදු කරන්න.

### අනුජය සෑදීම

බද්ධයේ ඉහළ කොටස අනුජය ලෙස හඳුන්වනු ලැබේ. අනුජය සෑදීමේදී, රූප සටහන 01 විස්තර කර ඇති පරිදි තේ රිකිලි වලින් ලබාගත් තනි පත්‍රයේ කැබලි වල සෙ.මී. 2 ක් දිග දඬු කොටසේ සෙ.මී. 1.5 ක කුඤ්ඤයක් සාදා ගන්න.

### ග්‍රාහකය සෑදීම

බද්ධයේ පහළ කොටස ග්‍රාහකය ලෙස හඳුන්වයි. මෙයද තනි පත්‍රයේ රිකිල්ලක් වන නමුත් මව් පත්‍රයට ඉහලින් හා පහලින් සෙ. මී. 2.5 ක දඬු කොටස් ඉතිරි කර කැපුම් යෙදිය යුතුය. එම ඉතිරි කර ගත් ඉහළ කොටසේ සෙ.මී. 1.5 ක පැල්මක් සාදාගන්න.



රූප සටහන 01 කුඤ්ඤය සාදාගත් අනුජය



රූප සටහන 02 :- ග්‍රාහකය



රූප සටහන 03 ග්‍රාහකයේ පැල්ම සැකසීම

### බද්ධ කර ගැනීම

ඉන්පසු සාදා ගත් අනුජයේ කුඤ්ඤය කොටස ග්‍රාහකයේ පැල්ම තුළට පත්‍ර දෙක දෙපසට වන පරිදි ඇතුල් කර එම



කොටස පොලිතින් පටියකින් පහළ සිට ඉහළට හොඳින් තදකර වෙලා ගැටයක් ගසා ගන්න. මේ සඳහා බද්ධ කිලිපයක්ද භාවිතා කල හැක.



රූප සටහන 04 : - බද්ධ වෙලීම

කෙසේ වෙතත් සෑම බද්ධ සුසංයෝජනයක්ම සාර්ථක නොවේ. සාර්ථක සුසංයෝග කිහිපයක් වන්නේ :

### නියඟයට ඔරොත්තු දෙන

| අනුජය | ග්‍රාහකය |
|---|---|
| TRI 2026 | DN |
| TRI 2025 | DG 39 |
| TRI 2026 | DG 39 |
| TRI 3025 | H 1 / 58 |
| TRI 2026 | H 1 / 58 |

### වටපණුවන්ට ප්‍රතිරෝධී

| අනුජය | ග්‍රාහකය |
|---|---|
| TRI 2023 | NEM9 |
| TRI 2023 | CY9 |
| TRI 2023 | DN |
| TRI 2023 | NEM 7 |
| TRI 2024 | NEM 7 |
| TRI 2024 | NEM 9 |
| TRI 2024 | DT1 |
| TRI 2024 | NEM 9 |
| TRI 2026 | NEM 7 |
| TRI 2027 | NEM 7 |
| TRI 62 /1 | NEM 7 |
| TRI 62 /1 | NEM9 |

එල්. ඒ. එස්. පී. ජයසිංහ